**සත්ත්ව චර්යා**

# සතුන්ගේ ලෝකයේ පෙම් රැඟුම්

## මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර


> සත්ත්ව ලෝකයේ පිරිමි සතුන්, ගැහැනු සතුන් ඉදිරියේදී මෙම රැඟුම් පායි. නැතහොත් ගැහැනු සතුන්, පිරිමි සතුන් ඉදිරියේ රැඟුම් පායි. මෙය වැඩි වශයෙන් ම සිදු වන්නේ ලිංගික ප්‍රජනන ක්‍රියාවලියේ දී යි.

සත්ත්ව ලෝකයේ සතුන්ගේ හැසිරීම් ගැන දැනුම සතුන් ගැන ඉගෙන ගන්නා කාලයේ සිට අද දක්වා ම සොයා බලා දැන ගත් දෙයකි. සතුන්ගේ ව්‍යුහීය, ක්‍රියාවලිය මෙන් මසතුගේ හැසිරීම ගැන දත යුතු කරුණු රැසකි. සතුන් ජීවත්වන පරිසරවල දී නැතහොත් ස්වභාවික පරිසරවල දී ඉගැනුමෙන් එහි තියම පිළිවෙළ දැන ගත හැක. ක්‍රියාවලියට සම්බන්ධ මෙවැනි හැසිරීම් රැසකි. සංසර්ගයට පෙර සත්ත්ව ලෝකයේ දක්නට ලැබෙන නොයෙක් රැඟුම් රැසකි. මෙය අපිට දැක්විය හැක්කේ සත්ත්ව ලෝකයේ 'පෙම් රැඟුම්' ලෙස ය. මෙය හඳුනා ගැනීම අපහසු දෙයක් නොවේ. මේ ගැන කරන ලද විමසීම් සහ දක්වන ලද අදහස් ඇත. එද චාලස් ඩාවින්ගේ කාලයේ සිට අද දක්වා ද එමට ය.


සත්ත්ව ලෝකයේ පිරිමි සතුන්, ගැහැනු සතුන් ඉදිරියේදි මෙම රැඟුම් පායි. නැතහොත් ගැහැනු සතුන්, පිරිමි සතුන් ඉදිරියේ රැඟුම් පායි. මෙය වැඩි වශයෙන් ම සිදු වන්නේ ලිංගික ප්‍රජනන ක්‍රියාවලියේ සංසර්ගයට පෙර යි. එය නැටුමක් ය. යම් ඉරියව්වක පිහිටීමක් හෝ ශබ්ද නගා හඬ ගෑමක් වන්නට පුළුවන. එක් සතෙක් එය සිදු කරන විට සමහර අවස්ථාවල දී සගයා ද නැත්නම් අතිත් සතා ද එය ම සිදු කර එකඟත්වය පළ කර යි. විද්‍යාත්මකව ගත හොත් මෙය යම් හැසිරීමක් ය.

සෑම හැසිරීමක් ම පෙම් රැඟුමක් යැයි සීමා කළ නොහැකි ය. සමහරවිට යම් කුරුලු විශේෂයකට තම පියාපත් වේලා ගැනීමට ඒවා විදහා සිටින්නට සිදු විය හැකි ය. එහෙත් මෙය පෙම් රැඟුමක් නොවනමුත් මෙය තවත් සතකුගේ හැසිරීමට හෝ කිරිල්ලකගේ දැක්මට කරන්නක් නම් එවැන්නක් නිසා උත්තර ලැබීමක් ඇත්නම් එයට 'පෙම් කෙළිය' නැත්නම් 'පෙම් රැඟුම' යැයි කිව හැකි ය. සත්ත්ව ලෝකයේ මෙයට ලොකු සතුන් හෝ පෘෂ්ඨවංශික පහත් සතුන් තුළත් කුරා කුහඹින් තුළත් දක්නට ලැබේ. අපෘෂ්ඨවංශිකයන් ලෙස සලකන කුඩා සතුන් ගැන බැලීමේ දී සංධිපාදිකයන්ගේ මෙය පැහැදිලිව දක්නට ලැබේ. (උදා: මැස්සන් වැනි) අපට මෙය දක්නට ලැබෙන, පරීක්ෂා කිරීමට හැකි මැස්සන් කොටසකි. 'හෝ මැස්සන්' නොහොත් 'කෝඳුරුවන්'. කෝඳුරුවන් ගේ පිරිමි මැස්සා ගැහැනු මැස්සා වටා කැරකීමට පටන් ගනී. හිස එදෙසට හරවා මෙය සිදු කරයි. එයට පසු එක තටුවක් සොලවමින් නැවත නැවතත් සිදු කරයි. අනතුරුව මුඛයෙන් දේහය ස්පර්ශ කිරීමට පටන් ගැනීමෙන් පසු සංසර්ගය සිදු වේ. මේ සතුන් වැඩි ගණනක් එක තැන වෙසෙන නිසා මෙවැනි සිදුවීම් එකවර දැක බලා ගත හැකි ය.

මකුළු වර්ග අතර දැක ගත හැකි රැඟුම් 'පෙම් ගමනක්' ලෙස ගැනීමට පුළුවන. මකුළු වර්ගවල පෙම් රැඟුම පාද එහා මෙහා සොලවමින් පිරිමි මකුළුවා ගැහැනු මකුළුවාගේ දෙපැත්තෙන් එහා මෙහා පැන පැන ගමන් කිරීමෙනි. මෙම රැඟුම් දක්නට ලැබෙන කුඩා සතුන් අතර තවත් කොටසකි, 'ෆිඩ්ලර් ක්‍රැබ්'. නැතහොත් නායක කකුළුවා ය. මෙම කකුළු විශේෂය ද පෙම් රැඟුම් දක්වන සතුන්ට හොඳ උදහරණයකි. මොවුන් විශාල ගණනක් එක තැන ගුල් හාරා ගෙන මුහුදු වෙරළේ වාසය කරති. කරදරයක් වූ විට ගුල තුළට රිංගා ගනී. මෙම සතාගේ එක් පාදයක් ලොකු ය. එය අඬුවක් ලෙස ඇත. එය වාදන භාණ්ඩයක් ලෙස තාලයකට උස් පහත් කරමින් වැනීම සිදු කරයි. විශේෂ අනුව ආකාරය ද වෙනස් ය. මෙසේ වාදනය කරමින් ගැහැනු සතා ඇති ගුල් අසලට ගොස් ඇයගේ කටුව ළඟට තැවරෙන සේ වනයි. එම රැඟුම සාර්ථක වුවොත් දෙදෙනා ම පිරිමි කකුළුවාගේ ගුල තුළට යයි. ඊට පසු සංසර්ගය සිදු වේ.



සත්ත්ව සංසර්ග අවධි



**දැල්ලා ගේ පෙම් රැඟුම්**

විශේෂයෙන් විශේෂයට හැසිරීම වෙනස් ය. පාදය වැනි මේ ක්‍රම ද ;වනස් ය. දැල්ලාගේ ද පෙම් රැඟුමක් ඇත. මේ අනුව දේහයේ පිට ඇති පාටවල වෙනස් වීමක් සිදු කරයි. මේ රැඟුමෙන් පසු එකතු වීමෙන් පිරිමි සතාගේ ඇති ග්‍රාහිකවල එක් ග්‍රාහිකාවක ඇති හෙක්ටෝකොටිලිය වැනි අවයවයකින් ගැහැනු සතාට ශුක්‍රාණු ඇතුළු කරයි. අනතුරුව පිරිමි සතා මිය යයි. පසුව මුහුදු පතුළට ගොස් බිත්තර දමා ගැහැනු සතා ද මිය යයි. බිත්තරවලින් පැටව් ඇති වන්නේ ඉන් පසුව ය.

කුඩා අපෘෂ්ඨ වංශික සතුන් මෙන් ම පෘෂ්ඨ වංශික සතුන් ද මේ රැඟුම් දැක්වීම් සිදු කරයි. මාළු ඇති කරන ටැංකිවල මසුන්ගේ හැසිරීම හා චර්යාවේ ද මෙය දැකිය හැකි ය. අප කවුරුත් ඇති කරන 'ගප්පියෝ' නම් මාළු බලමු. 'ලෙබිස්ටෙස් රෙටිකියුලාටුස්' යන විද්‍යාත්මක නමින් හැඳින්වෙන මෙම මසුන් ට්‍රිනිඩෑඩ් හා දකුණු ඇමරිකාවේ අග්නිදිග වෙරළබඩට ආවේණිකයක ය. සංසේචනය අභ්‍යන්තර ය . ජලාබුජ ය. කුඩා මසුන් ඉපැදුණු අවධියේ ම නිදහස් ය. මෙම මසුන් එකතු වී රැන් වශයෙන් පිහිනති. මොවුන්ගේ ද පෙම් රැඟුම් විධි කීපයකි. මුලින් ම පසු පසින් ගොස් අවසන මුහුණට මුහුණලා එහා මෙහා පාවී යයි. ඉන්පසු 'S' ගමන සිදු කර සංසර්ගය සිදු වේ.

මෙම මසුන්ගේ ගැහැනු සතුන් තරමක් ලොකු ය. පාටක් නැත. ඇතත් වලග පමණකි. පිරිමි සතුන් පාට සහිත ය. වරල වඩාත් පැහැපත් ය. එම නිසා හඳුනා ගැනීම පහසු ය. ජීවත්වන ප්‍රදේශයේ සිදු වන, පෙම් රැඟුම දක්වන මත්ස්‍යයෙකි, 'තිලාපියා'. නැතහොත් අප දන්නා 'ජපන් කොරලි' යි. පළමුව පිරිමි මත්ස්‍යයා ප්‍රදේශයක් වෙන් කර ගනී. මඩ ඇති තැනක කුඩා වළක් හාරා සූදනම් වේ. ඊට පසු ගැහැනු සතා කැඳවා ගෙන එන්නේ පෙම් රැඟුම් පාමිනි. එකිනෙකා මාරුවී වලිග වරලය අල්ලා කරකැවෙමිනි. මේ අයුරින් තනා ඇති ස්ථානයට ගොස් (සංසේචනය බාහිර නිසා) බිත්තර හා ශුක්‍රාණු දමා යයි. එම බිත්තර ගැහැනු සතාගේ කට තුළට ගෙන පිහිනා යයි. බීජෝෂණය ඇති වන්නේ ගැහැනු සතාගේ මුඛය තුළ ය. පැටවුන් රැකීමට ද මුඛය උපයෝගී කර ගනී. මසුන් ගැන බලන විට හැසිරීම සඳහා විශේෂ ප්‍රදේශ ඇති විට පෙම් රැඟුම් එක් අයුරකින් සීමා කිරීමක් ද සිදු කරයි.


සත්ත්ව ලෝකයේ විශේෂ 'පෙම් රැඟුම්' දැකිය හැක්කේ කුරුලු විශේෂ වල ය. මෙවැනි ක්‍රියා එකයුරුව සිදු කිරීමට හේතුවක් වන්නේ කුරුල්ලන් කැදලි, කූඩු තනන්නේ ආරක්ෂිත ප්‍රදේශවල නිසා ය. කුරුල්ලන්ගේ පෙම් රැඟුම්වලට පරිසරය බලපායි. මසුන්ට පෙනුම දුර අඩු නිසා කෙටි පරිසරයක් බලපායි. එහෙත් කුරුල්ලන්ගේ පරිසරය ඉතා විශාල නිසාත් පියාඹා යා හැකි නිසාත් මෙම පෙම් රැඟුම් සිදු කරන ස්ථාන ඉතාමත් විවිධ ය. දුර ප්‍රමාණයත් වැඩි ය. කුරුලු හැසිරීමේ විශේෂ ලක්ෂණය, එම සතුනගේ ගායනය යි; මිහිරි ගී නාදය යි. මෙය කුරුලු පෙම් රැඟුම් වල රසවත් ම දෙය යි. එය කිරිල්ලයක් ගෙන්වා ගැනීමෙන් තම ප්‍රදේශවල හිමිකම් කියා පැමටත් අවශ්‍ය ම දෙයකි. එය ඈතට විහිදී යන්නකි; සැඟවී සිට ගායනා කළත් එය උපරිම ප්‍රයෝජනය ලැබෙන දෙයකි.

සත්ත්ව ලෝකයේ විශේෂ 'පෙම් රැඟුම්' දැකිය හැක්කේ කුරුලු විශේෂ වල ය. මෙවැනි ක්‍රියා එකයුරුව සිදු කිරීමට හේතුවක් වන්නේ කුරුල්ලන් කැදලි, කූඩු තනන්නේ ආරක්ෂිත ප්‍රදේශවල නිසා ය. කුරුල්ලන්ගේ පෙම් රැඟුම්වලට පරිසරය බලපායි.

මේ හඬ විශේෂවලටත් එකිනෙකාටත් සීමා වූවකි. එය සහජයෙන් ලැබූවකි. එසේ ම වෙනස් විශේෂ සමග සංසර්ග වීම වැළැක්වීමේ එක ම සංසිද්ධිය යි.

ඕනෑම කුරුල්ලෙක් ගතහොත් එම සතා ජීවත්වන පරිසරයේ දී ඔවුන් පාන පෙම් රැඟුම් එකාකාරයෙන් විදහා පායි. මෙය කැදලි තැනීමත් සංසර්ගයත් යන දෙක සමග සමාන්තරව යන්නකි.

සෑම වර්ගයක ම කුරුල්ලන් අතර සාමාන්‍යයෙන් දක්නට ලැබෙන පීඩන ක්‍රම නැතහොත් ගමන් ක්‍රම දෙකකි. එකක් පිල් විදහා පැනීම හෝ ගමන යි. මෙය පළමුව සිදු වන්නකි. කෙටි ගමන් කීපයක් ම කිරිල්ලට ඉදිරියෙන් යයි. දෙවැනි ක්‍රමය හොටය උස්සාගත පැනීම හෝ ගමන ය. හොටය උස් පහත් කරමින් මෙය සිදු කරයි. මෙය සෑම කුරුලු විශේෂයකට ම උරුම වූවකි; පිල් විදහා නැටීම ගැන දැකිය හැකි චමත්කාර ම නැටුම



**පිල් විදහා පෙම් රැඟුම් දක්වන ෆෙසන්ට් කුරුල්ලා**

සිදු කරත්තේ මොතරුත් ය. මෙය ඉතා දර්ශනීය දසුනකි.

මා ඉන්දියාවේ ගත කළ කාලයේදී කීප වරක් ම පන්ජාබයට ගියෙමි. පන්ජාබයේ කෘෂිකාර්මික ප්‍රදේශවල ධාන්‍ය රාශියක් ඇති නිසා සෑම ගෙවත්තකට ම පාහේ එන මොතරුත් පිල් විදහා නැටීම සුලබ දසුනකි; අප රටෙහි ද වනෝද්‍යානවල ද මෙය දැකිය හැකි දෙයකි, සේරු හංස වර්ග රැඟුම්; මෙම සතුන් ජලයේ ජීවත්වන නිසා මොවුනගේ පරිසරය ජලය යි. මේ පෙම් රැඟුම පවුල් සමූහවලට සීමා වේ. මොවුන් පළමුව පිහිනන අතර හිස වතුර යට සඟවමින් එහා මෙහා යයි. මේ අයුරින් අනෙකුත් කුරුල්ලන් ද මෙය සිදු කරයි. මෙහිදී පළමුව හොටය පෙදෙස වතුරට යටට කරයි. වලිග පෙදෙස ද මෙසේ ම යට කරයි. ජලය විසුරුවා හැරීමෙන් පසුව මොවුන් එකතු වේ. පැටවුන් බලා ගැනීම ගැහැනු සතාට පමණක් සීමා කර අනික් සතුන් සමූහවලට වී කල් යව යි.

පෘෂ්ඨ වංශික සතුන් අතුරින්, උභය ජීවීන් වන මැඩි, ගෙම්බි වර්ගවල පිරිමි සතා බිත්තර දැමීමට සකස් වූ ගැහැනු සතාගේ පිට උඩ නැගී ගමන් කර බාහිර සංසේචනය සිදු කරයි. උරග වර්ග වල ද පෙම් රැඟුම් දැකිය හැකි ය. විශේෂයෙන් එකට වෙලී සිටින උරග වර්ග දැක ගත හැකි වේ. ක්ෂීරපායී සත්ත්ව විශේෂ ද මෙයට සඳහන් රාශියකි.

විද්‍යාත්මක ඇසින් බැලිමේ දී සත්ත්ව ලෝකයේ මෙවැනි පෙම් රැඟුම් රාශියකි. එහෙත් සත්ත්ව පරිණාමය ගැන අදහස් දැක්වීමේදී එය පරිණාමය සඳහා ඇතිවූ එක් සාධකයක් ලෙස හැඟේ. පෙම් කෙළි දක්වන සතෙක්, ඒ සතුන් අතරින් අනෙක් සතකුට වඩා සුදානම් දක්වන්නේ නම් ස්වභාවික වර්ණය අනුව තේරීම සිදු වේ.

මෙය එදා සිට ම චාල්ස් ඩාවින්ගේ පරිණාම න්‍යාය අනුව පෙන්වා දුන් දෙයකි. මේ අනුව මෙය ලිංගික වරණය සඳහා අවශ්‍ය වූ දෙයකි යන්න කිවහැකි යි. පරිණාමික අදහස් දැක්වීමෙන් පසු මෙම ක්‍රියාවලියේ යන්ත්‍රනය අනුව සමහර උදහරණ ස්නායු සම්බන්ධ ක්‍රියාවක් ලෙස දැක් වේ. යම් ආවේග සඳහා ද ක්‍රියා සිදු වේ. මේ අයුරින් ආවේග රසායනිකව පාලනය කළ හැකි ය . දෙවනුව මෙය හෝමෝන වල ක්‍රියාවලියකි. අන්තරාසර්ගි ග්‍රන්ථි මගින් නිපදවන හෝමෝන ක්‍රියාවලියක බලපෑම කි. විශේෂයෙන් ම ලිංගික හෝමෝන බලපායි. එහි ක්‍රියාකාරිත්වය නිසා මෙවැනි දෙයට පෙළඹේ. පසුව එය ස්නායුක ක්‍රියාවලියට පරිවර්තනය විය හැකි ය. මොළයට ද සීමා වී ඇත. මොළයේ හයිපොතැලමසයේ ලිංගික ක්‍රියාවලි පාලනය කරන පෙදෙසේ ක්‍රියාකාරි ස්වභාවය නිසා මෙය ඇතිවීමට ඉඩ ඇත.

තවත් අයුරකින් සටහන් කළහොත් මෙය සමාජ ලිංගක සබඳතාවකි. ලිංගික සබඳතාවල සමාජයිය අදහස් සතුන් සම්බන්ධයෙන් ද දක්වා ඇත. එනිසා හෝමෝන ක්‍රියාවලිය හොඳ නිදසුනකි. එක් එක් විශේෂවල හැසිරිම සතුන්ගේ දහන පමණක් නොව දහන සඳහා කරන වෑයමට ද හෝමෝන බලපෑම් කරයි. කෘමීන් ගතහොත් ඉතා සංකීර්ණ ය. මී මැසි රජදහන රැජන හා පිරිමි මැස්සන්ගේ ආධිපත්‍යය ලෙස සැලකේ . උසස් සතුන් පට්ටි වශයෙන් හෝ සමූහ වශයෙන් ජීවත් වුවත් පිරිමි සතුන් හිමිකරුවන්ගේ තැන ලබා ඇත. මුව, මුහුදු සිංහන්ගේ මෙම ලක්ෂණ දැක ගත හැක. මුහුදු සිංහයන් භූමියට විත් තමන්ට හැකි අයුරු පට්ටි වශයෙන් සෑදී ගැහැනු සතුන් එනතුරු බලා සිට එසේ ආ පසු තැන් වෙන් කර 9 ක් හෝ 10කින් යුතු ස්ථානයක් සාද ගනී. අන්තර් පිරිමි විරුද්ධතාවකි. මෙය සමාජ ලිංගික සම්බන්ධතාවකි.

සියලු දෙය සලකන විට මෙය පරිණාමික ක්‍රියාවලියට එදා චාල්ස් ඩාවින් කියා පෑ ස්වභාවික වරණයේ එක් අදහසක් වූ 'ලිංගික වරණය' තහවුරු කිරීමකි. සරල ඇසින් බැලුවහොත් සත්ත්ව ලෝකයේ පුදුමාකාර සිදුවීම්වලින් එකකි. මේ රැඟුම් සමහර සතුනට පරිණාමය වී ඇත. නැත්නම් පෙලඹවීමක් වී ඇත. සමහරුනට නොමැත. එහෙත් විද්‍යාත්මක ඇසින් බැලුවහොත් තවත් පිළිතුරු රැසකට දොර ඇරේ. ❑